**SAMODHANA JOURNAL**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

2024 Volume 13 Issue II

# මහනුවර සම්ප්‍රදාය නිරූපණය වන පහළ වළවේ නිම්නයේ සිතුවම් කලාවේ ආරම්භය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ. ඊ ජේ .සාගර කැළුම්[1] , ආචාර්ය දර්ශන බණ්ඩාර[1]

Received Date: 10th October 2024
Accepted Date: 02nd January 2025
Published Date: 02nd February 2026

## Abstract

Painting is a universal language that expresses people's thoughts and desires. Sri Lanka has a history of thousands of years in this art. The research article titled The Origin of Painting in the Lower Walawe Valley and the Investigation of Temple Paintings of the Kandy Period has been prepared with the aim of revealing the origin of the art of painting in the Lower Walawe Valley, which belonged to the Rohana Kingdom, a unique administrative center in the history of Sri Lanka, and how the art of painting has evolved through various eras to the present day. There was a special relationship between the coastal region of Sri Lanka and the Kandy Kingdom. There have been political and cultural relations between the coastal region of Sri Lanka and the country's interior since ancient times. There is evidence that in the prehistoric period, the people living in the interior of the country used seashells and salt from the coast. There was also a close relationship between the Ratnapura district and the Southern Province. We know that the region including Ratnapura was under the control of the Kandy Kingdom. As a result, the Kandy regional influence may have reached the southern coast via the Ratnapura region. The research problem is why many researchers who researched the origins of ancient painting in Sri Lanka and the paintings of the

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
sagarajsk@gmail.com

Kandyan period did not direct their previous research toward the paintings of the Lower Wala Valley. The remaining problem is why attention was not paid to painting as a source for identifying the regional historiography of the Lower Wala Valley. This research was conducted to resolve these problems. This research was conducted through source and field studies, focusing on the special artistic features found in those paintings in the history of ancient painting. In it, attention was paid to ancient temples such as the Hatagala Purana Rajamaha Viharaya, Welipatanwila Pulinathalaramaya, and Welipatanwila Gangaramaya in the Lower Wala Valley. Here, it was found that the beginning of painting in the Lower Walawe Valley, the development of painting during the Kannadigas period, the lack of researchers' interest in conducting research in this regard, and the lack of attention paid to the conservation of paintings are at risk of destroying these paintings. Paintings from the Anuradhapura period were found at sites such as Sithulpawwa and Karambagala, but this research found that paintings belonging to the Kandy tradition are mostly found in Ruhuna.

Keywords: Paintings of the Kannadigas period, Lower Walawe Valley, Painters, Beginning of painting, Characteristics of paintings

## සාරසංක්ෂේපය

චිත්‍ර කලාව ජනතාවගේ සිතුම් පැතුම විදහා දක්වන විශ්ව භාෂාවකි. මෙකී චිත්‍ර කලාව සම්බන්ධව ශ්‍රී ලංකාව අවුරුදු දහස් ගණනක ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. ලංකා ඉතිහාසයේ සුවිශේෂී පරිපාලන මධ්‍යස්ථානයක් වූ රෝහණ රාජධානියට අයත් පහළ වලවේ නිම්නයේ සිතුවම් කලාවේ ආරම්භය, හා විවිධ යුග වල දී වෙනස් වීම් වලට ලක් වෙමින් වර්තමානය දක්වා සිතුවම් කලාව විකාශනය වූ ආකාරය පිළිබඳ ව හෙළිදරව් කිරීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් පහළ වලවේ නිම්නයේ සිතුවම් කලාවේ ආරම්භය හා නුවර යුගයේ විහාර සිතුවම් පිළිබඳ විමර්ශනය නම් පර්යේෂණ ලිපිය සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය සහ මහනුවර රාජධානිය අතර සුවිශේෂී සම්බන්ධතාවයක් තිබිණි. අතීතයේ සිට ම ලංකාවේ වෙරළබඩ කලාපය සහ රට අභ්‍යන්තරය අතර දේශපාලනික සහ සංස්කෘතික සබඳතා තිබිණි. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී වෙරළබඩ ආශ්‍රිත මුහුදු බෙල්ලන්, ලුණු වැනි සාධක රට අභ්‍යන්තරයේ වාසය කළ පිරිස් භාවිත කළ බවට සාධක ලැබේ. තවද රත්නපුර දිස්ත්‍රික්කය සහ දකුණු පළාත අතර සමීප සම්බන්ධයක් තිබිණි. රත්නපුර ඇතුලු කලාපය මහනුවර රාජධානිය යටතේ පැවති පාලන ප්‍රදේශයක් බව අපි දනිමු. මේ හේතුවෙන් රත්නපුර කලාපය හරහා මහනුවර කලාපීය ආභාසය දකුණු වෙරළ තීරයට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය. ලංකාවේ පැරණි සිතුවම් කලාවේ ආරම්භය සහ මහනුවර යුගයේ සිතුවම් පිළිබඳ ව පර්යේෂණ සිදු කළ බොහෝ පර්යේෂකයන් සිය පූර්ය පර්යේෂකයන්ගේ අවධානය පහළ වළවේ

නිම්නයේ සිතුවම් කෙරෙහි යොමු නොවුණේ ඇයි? යන්න පර්යේෂණ ගැටලුව වේ. පහළ වලවේ නිම්නයේ ප්‍රාදේශීය ඉතිහාසකරණය හඳුනා ගැනීම සඳහා මූලාශ්‍රයක් ලෙස චිත්‍ර කලාව පිළිබඳ ව අවධානය යොමු නොවූයේ කවර කරුණක් නිසාද? යන අවශේෂ ගැටලුව මෙහි දී මතු විය. එම ගැටලු නිරාකරණය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කෙරිණි. පැරණි සිතුවම් කලාවේ ඉතිහාසය, එම සිතුවම් තුළ දක්නට ලැබෙන විශේෂ කලාත්මක ලක්ෂණ වැනි දෑ කෙරෙහි අවධානය යොමු කරමින් මූලාශ්‍රය අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. එහි දී පහළ වලවේ නිම්නයේ හාතාගල පුරාණ රජමහා විහාරය, වැලිපටන්විල පුලිනතලාරාමය, සහ වැලිපටන්විල ගංගාරාමය ආදී පුරාණ විහාරස්ථාන පිළිබඳ ව අවධානය යොමුකරණ ලදි. මෙහි දී පහළ වලවේ නිම්නයේ චිත්‍ර කලාවේ ආරම්භය පිළිබඳ වත් නුවර යුගයේ සිතුවම් කලාව වර්ධනය වූ ආකාරයත් මේ හා සම්බන්ධව පර්යේෂණය සිදු කිරීම සම්බන්ධව පර්යේෂකයන්ගේ උනන්දුව නොමැතිකම සහ සිතුවම් සංරක්ෂණය කිරීම සම්බන්ධව ඇති අඩු අවධානය හේතුවෙන් මෙම සිතුවම් විනාශ වී යාමේ අවදානමකට මුහුණ පා ඇති බව ද හඳුනා ගනු ලැබිණි. අනුරාධපුර යුගයේ බිහි වූ චිත්‍ර සිතුල්පව්ව, කරඹාගල වැනි ස්ථාන වල පැවති නමුත් රුහුණේ වැඩිපුර හමු වන්නේ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් බව මෙම පර්යේෂණයේ දී නිරීක්ෂණය විය.

**ප්‍රමුඛ පද -** නුවර යුගයේ සිතුවම්, පහළ වලවේ නිම්නය, සිත්තරුන්, සිතුවම් කලාවේ ආරම්භය, සිතුවම්වල ලක්ෂණ

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මෙරට ආරම්භ වන සිතුවම් කලා සම්ප්‍රදාය විසි වන ශතවර්ෂය දක්වා දිවෙන පොහොසත් සිතුවම් කලා සම්ප්‍රදායක් දක්වා විකාශනය වී ඇත. ක්‍රි.පූ. 3 වන 2 වන ශත වර්ෂවලට අයත් එනම් මුල් ඓතිහාසික යුගයට අයත් යැයි පුරා විද්‍යාඥයින් නිශ්චිතව ම හඳුනා ගෙන ඇති ලෙන් සහ ගුහා චිත්‍ර මේ වන විට හමුව ඇත (මහින්ද හිමි, 2007:4). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කළුතර දිස්ත්‍රික්කයේ ෆාහියන් ලෙන භූගත කැණීම් වල දී සොයා ගත් මිනිස් හිස් කබල් පහක් ඇතුළුව සත්ව ඇටකටු, ආයුධ සහ සායම් තැවරුණ ගල් කැබලි සමූහය ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර කලාව සම්බන්ධව වැදගත් සාධක සපයයි . ඇමරිකාවේ බීටා ආයතනය විසින් කරණ ලද පර්යේෂණ වලින් පසු මෙම පුරා සාධකවල වයස අවුරුදු 31000 ක් බව නිගමනය කර ඇත.

ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් සංධිස්ථානයක් වන දේවානම් පියතිස්ස රාජ සමයේ සිදු වූ මහින්දාගමනය ලාංකික ජන ජීවිතය නව මගකට යොමු කිරීමක් විය. එනම් ලංකාවට බුදු දහම පැමිණීමට පෙර සිට මෙරට චිත්‍ර කලාවක් පැවති බවට සාධක හමුව ඇති නමුත් බුදු දහම ලංකාවට පැමිණීමෙන් පසු බුදු සිරිත ආශ්‍රය කර ගනිමින් මෙරට චිත්‍ර කලාවේ යම් වර්ධනයක් සිදු ව ඇති බව පෙනී යයි. ඊට සමගාමීව සිදු වූ ශ්‍රී මහා බෝධි ආගමනයත් සමග සංඝමිත්තා තෙරණිය හා මෙරටට පැමිණි විවිධ ශිල්පීය නිපුණතාවෙන් යුත් පිරිසක ගේ සම්ප්‍රාප්තිය සමග මෙරට තුළ

නව බෞද්ධ ශිෂ්ටාචාරයක් නිර්මාණය වන්නට විය (සිංහල මහාවංශය, 2010:81) ඒ ඔස්සේ භාෂාව සාහිත්‍ය ය සහ ගෘහ නිර්මාණ ශිල්පය බිතු සිතුවම් කලාව ආදී සැම අංශයක ම ශීඝ්‍ර දියුණුවක් උදා විය. ඒ සම්බන්ධව සිංහල මහාවංශය වැනි ලිඛිත මූලාශ්‍ර සාධක හමුව ඇත. (සිංහල මහාවංශය 19 පරි 1,4.ගාථා, 2010). එසේම ලෙන් ලිපි සෙල්ලිපි ඇතුළු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සාධක ද මෙම බෞද්ධ හා සංස්කෘතික දියුණුව සිදු වූ බව සනාථ කරයි. මෙලෙස ප්‍රාග් ඓතිහාසික යුගයේ ආරම්භ වූ ලංකාවේ සිතුවම් කලා ව අනුරාධපුර අවදියේ දී දියුණුවට ලක් වෙමින් මහනුවර යුගය දක්වා විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් විසි එක් වන ශතවර්ෂය දක්වා අංකඩ ව විකාශනය වූ ආකාරය සම්බන්ධව සාකච්ඡාවට ලක් කිරීම මෙහි දී මූලික පරමාර්ථය බවට පත්ව ඇත.

## සාහිත්‍ය විමර්ශනය

පහළ වේලි ඔය නිම්නයේ සිතුවම් කලාවේ ආරම්භය හා නුවර යුගයේ විහාර සිතුවම් පිළිබඳ විමර්ශනය යන පර්යේෂණ මාතෘකාව යටතේ විධිමත් ලෙස පර්යේෂණයක් කිරීමේදී පර්යේෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන දත්ත එක්රැස් කිරීමේ දි ද්විතීක මූලාශ්‍රයවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම පර්යේෂණ මාතෘකාව අලළා ඍජු වම කතුවරයන් විසින් ලියන ලද පොත පත සොයා ගැනීමට නො හැකි වූවද සිතුවම් කලාවේ ආරම්භය, සහ නුවර යුගයේ උඩරට සහ පහත රට සිතුවම් කලාව සම්බන්ධව විවිධ කතු වරුන් විසින් ලියන ලද ග්‍රන්ථ කිහිපයක් සොයා ගැනීමට හැකි විය. මෙම ග්‍රන්ථ කතුවරයන් සියලු දෙනාගේ පොදු නැමියාව වන්නේ ජනප්‍රිය ප්‍රදේශවල චිත්‍ර පිළිබඳ ව ඉතිහාසය දැක්වීමයි. නමුත් කිසිම මූලාශ්‍රයක් වලවේ නිම්නයේ පැරණි චිත්‍ර කලාව සම්බන්ධව සාකච්ඡා කර නැත. නමුත් එම ග්‍රන්ථවල ඇතුළත් ඇතැම් තොරතුරු මෙම පර්යේෂණයේ සාර්ථකත්වය සඳහා උපයෝගී කර ගත හැකි ය. එම ග්‍රන්ථ අතර පහත ග්‍රන්ථ මෙම පර්යේෂණය සඳහා වැදගත් ආලෝකයක් සපයයි.

01 මහින්ද හිමි. උනුවතුර බුබුලේ, (2007), දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. දකුණේ වි

02 හේම ශ්‍රී, අමරසිංහ (2000), චිත්‍ර කලාව, ගනේමුල්ල: නිශාන්ත ප්‍රකාශන.

03 විතානගේ. පුණ්‍යදාස, (2007), චිත්‍ර කලාව ඇගයීම, කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

04 ඉලයප්ආරච්චි. එරික්, (1995),චිත්‍ර කලාව සහ විචාරය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

05 සෝමතිලක,මහින්ද(2004), පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව,කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඉහත ස.දහන් ග්‍රන්ථවලින් මූලික ව අවධානය යොමු කර ඇත්තේ පොදුවේ චිත්‍ර කලාව සම්බන්ධවයි. නමුත් මෙම පර්යේෂණයේ දී පහළ වලවේ නිම්නයට

අවධානය යොමු කරමින් පර්යේෂණය සිදු කර ඇත. එබැවින් මෙම පර්යේෂණයේ දී පූර්ව පර්යේෂණවල දී සාකච්ඡා නොකළ කරුණු වෙත අවධානය යොමු කළ පර්යේෂණයකි. විශේෂයෙන් පහළ වලවේ නිම්නයේ සමකාලීන සමාජය පිළිබඳ හැදෑරීමට චිත්‍ර සම්ප්‍රදායන් යොදා ගැනීම වැනි අංශ වෙත අවධානය යොමු කරන ලදී.

දිවයිනේ පැරණි චිත්‍ර සම්ප්‍රදායන් කිහිපයක් හඳුනාගත හැකි ය. චිත්‍ර කලාවේ වැදගත් යුගයක් වන මහනුවර යුගයේ සිතුවම් කලාව පිළිබඳ ව විමර්ශනය කරමින් දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර නැමති ග්‍රන්ථය මගින් උණුවතුර බුබුලේ මහින්ද හිමි විසින් පුරාණ රෝහණ රාජධානියට අයත් ප්‍රදේශ කිහිපයක විහාර සිතුවම් පිළිබඳ ව අනාවරණය කර ඇත. මහනුවර යුගයේ උඩරට විහාර සිතුවම් හා සම කාලීනව සිතුවම් කරණ ලද පහත රට විහාර සිතුවම් පිළිබඳ ව තොරතුරු රාශියක් මෙම ග්‍රන්ථයේ අන්තර් ගත වී ඇත. එහි දෙවන පරිච්ඡේදයේ පිටු අංක 55-115 " පහත රට විහාර කිහිපයක් සිතුවම් පිළිබඳ ව විග්‍රහ කර ඇත. එම ග්‍රන්ථයේ සිතුවම් තුළින් නිරූපිත කරුණු සහ විෂය ක්ෂේත්‍රය පිටු අංක 116- 229 මහනුවර යුගයේ විහාර සිතුවම් සඳහා යොදා ගත් ශිල්ප ක්‍රම , මෙම සිතුවම් තුළින් සිදු කරනු ලබන සමාජ මෙහෙවර පිටු අංක 291-323 යනාදී වශයෙන් ඉතා වැදගත් කරුණු රාශියක් සම්බන්ධව අවධානය යොමු කර ඇත. නමුත් මෙම ග්‍රන්ථයේ මෙම පර්යේෂණය සිදු කරනු ලබන පහළ වලවේ නිම්නයේ විහාර පිළිබඳ ව අවධානය යොමු කර නොමැත.

ඉහත සඳහන් කරුණු හා සමාන නිරීක්ෂණයක යෙදෙන මහින්ද සෝමතිලක මහතා පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව නැමති කෘතියේ මෙම පර්යේෂණය සිදු කරන වලවේ මිටියාවත සිතුවම් කලාව පිළිබඳ ව අවධානය යොමු කර නොමැති නමුත් සිතුවම් කලාවේ ආරම්භය සහ විකාශනය, පිටු අංක 17-84, මහනුවර යුගයේ සිතුවම් කලාව, පිටු අංක 119-148 සහ නුවර යුගයේ කලා සම්ප්‍රදාය පිළිබඳ ව පිටු අංක 240-280 ද මහනුවර යුගයේ සිතුවම් සහිත උඩරට විහාර සම්බන්ධව විග්‍රහ කර ඇත. නමුත් මෙම ග්‍රන්ථ දෙකේ දීම රෝහණයේ වැඩි අවධානයක් සහිත ක්ෂේත්‍ර පිළිබඳ ව අවධානය යොමු කළ ද පහළ වලවේ නිම්නය පිළිබඳ ව හෝ පර්යේෂණයට ලක් කරන විහාර සම්බන්ධව අවධානය යොමු වී නොමැති බව සඳහන් කළ යුතු ය.

ලංකාවේ සිතුවම් කලාව සම්බන්ධව හේම ශ්‍රී අමරසිංහ, මහතා විසින් රචිත චිත්‍ර කලාව, නැමති ග්‍රන්ථයෙන් මෙම පර්යේෂණය සිදු කරනු ලබන වලවේ මිටියාවත චිත්‍ර කලාව පිළිබඳ ව අවබෝධයක් ලබාගැනීමට නො හැකි වූවද මොහු විසින් පුරාණ ලංකාවේ යුග සහ චිත්‍ර සම්ප්‍රදායන් (පිටු අංක 14- 28) මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත කර ඇත. නමුත් පර්යේෂණයට ලක් කරනු ලබන පහළ වලව නිම්නය වෙත අඩු අවධානයක් යොමු කර ඇත. මහනුවර යුගයේ චිත්‍ර වල විශේෂ ලක්ෂණ තුළින් සමස්ත මහනුවර යුගයට ම පොදු වූ සිතුවම් ලක්ෂණ සම්බන්ධව සාකච්ඡා කර ඇත. පොදුවේ ගත් කල සියලුම පර්යේෂකයන් තම

පර්යේෂණ සිදු කිරීමේ දී රෝහණ රාජධානියේ ඉතා වැදගත් භූමියක් වන පහළ වලවේ නිම්නය වෙත අඩු අවධානයක් යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

## අධ්‍යයන ක්‍රමවේදය

පහළ වේලි ඔය නිම්නයේ සිතුවම් කලාවේ ආරම්භය හා නුවර යුගයේ විහාර සිතුවම් පිළිබඳ ඇගැයීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේද මගින් දත්ත ඒකරාශී කර ගැනීම සිදු කරනු ලැබේ. ක්ෂේත්‍ර නොවන ගවේෂණය යටතේ මූලික වශයෙන් මූලාශ්‍ර පරිශීලනයක් කරනු ලබන අතර එහි දී ප්‍රාථමික සහ ද්විතීක දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනයක් සිදු කරනු ලැබීය. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය යටතේ සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යා පර්යේෂණ සම්බන්ධ වාර්තා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මේ හා සම්බන්ධව ඇති පර්යේෂණ වාර්තා පරිශීලනය කල අතර ද්විතීක මූලාශ්‍රය යටතේ මේ සම්බන්ධව සිදු ව ඇති පර්යේෂණ නිබන්ධන මහනුවර යුගයේ සිතුවම් කලාව සම්බන්ධව ඇති පොත්, සඟරා, අවශ්‍ය තොරතුරු ලබාගැනීමෙහි නිරත විය. ඊට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සිදු කරන ලද සංරක්ෂණ වාර්තා ආදිය ද පරිශිලනය කරන ලදී. අනතුරුව මහනුවර යුගයේ සිතුවම් කලාව සම්බන්ධව අධ්‍යයනයක් ලබා ගැනීමට ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීමට කටයුතු කර හාතාගල පුරාණ විහාරය, වැලිපටන්විල පුලිනතලාරාම පුරාණ විහාරය, ගංගාරාම පුරාණ විහාරය, කරඹාගල රාජමහා විහාරය, ආදී ස්ථාන අධ්‍යයනයට ලක් කළ අතර එම විහාරවල ඇති සිතුවම් පිළිබඳ ව, එහි ඓතිහාසික පසුබිම, සිතුවම් කළාවේ ලක්ෂණ ආදී සම්බන්ධයෙන් කරුණු ද ඡායාරූප ද ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය. තවද පරිමානයට අනුව සිතුවම් ඇදීම ද සිදු කෙරිණි.

## අරමුණ හා වැදගත්කම

මෙම අධ්‍යයනය තුළින් වලවේ නිම්නයේ පර්යේෂණ අවධානය යොමු නොවූ මහනුවර යුගයේ සිතුවම් සහිත ස්ථාන අධ්‍යයනයට බඳුන් කල හැකි විය. මෙම පර්යේෂණයේ දී පහත සඳහන් අනු අරමුණු ද අධ්‍යයනයට පාත්‍ර විය.

1 අනුරාධපුර අවධියේ පහළ වලවේ නිම්නයේ සිතුවම් කලාවේ ව්‍යාප්තිය හඳුනා ගැනීම සහ නුවර යුගයේ සිතුවම් කලාවේ ව්‍යාප්තිය හඳුනා ගැනීම.

2 ඓතිහාසික කලා උරුමයන් පිළිබඳ ව අවධානය අඩු වීම නිසා විනාශයට ලක් වන බෞද්ධ කලා උරුමයන් පිළිබඳ ව සාක්ෂි අනාවරණය කිරීම

බොහෝ පර්යේෂකයන් වැඩි අවධානය යොමුව ඇත්තේ ප්‍රකට ක්ෂේත්‍ර කේන්ද්‍ර කරගෙන පර්යේෂණ සිදු කිරීමයි. නමුත් කිසිදු මූලාශ්‍රයක පහළ වලවේ නිම්නයේ සිතුවම් කලාව සම්බන්ධව සිතුවම් කලාව පිළිබඳ ව සාකච්ඡා කර නොමැත. පහළ වලවේ නිම්නයේ ප්‍රාදේශීය ඉතිහාසය පිළිබඳ ව සිදු කර ඇති අධ්‍යයනයන් ද ඉතා සීමිත වේ. එ නිසා ප්‍රාථමික මූලාශ්‍රයක් වන සිතුවම් තුළින්

ප්‍රාදේශීය ඉතිහාසකරණය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ සුවිශේෂී වැදගත් කමක් වේ.

## ශ්‍රී ලංකාවෙහි පැරණි චිත්‍ර කලාව හා මහනුවර යුගයේ සිතුවම් කලාව

- **ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් කලාවේ ආරම්භය හා විකාශනය**

ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ ආරම්භය පිළිබඳ ව විමසීමේ දී ක්‍රි.පූ. 3 වන, 2වන සියවස දක්වා ඈතට දිවෙන දීර්ඝ ඉතිහාසයකට උරුම කම් කියනු ලබයි. ලංකාවේ ආර්ය ජනාවාස ව්‍යාප්ත වීමට පෙර හෝ බෞද්ධ සංස්කෘතිය මෙරට ව්‍යාප්ත වීමට පෙර පැවති සිතුවම් කලාව පිළිබඳ ව ගවේෂණය කළ පර්යේෂකයන්ට ඉතා දුර්ලභ ගණයේ ගුහා චිත්‍ර කිහිපයක් හමුව තිබේ. නො දියුණු සංස්කෘතියකට උරුම කම් කියූ ප්‍රාග් ඓතිහාසික මානවයින් වර්ෂා කාලවල දී ඈත වනයේ පිහිටි ස්වාභාවික ගල් ගුහා තාවකාලික වාසස්ථාන ලෙස පාවිච්චි කරන විට ලැබුණු විවේක අවස්ථා වලදී යට කී සිතුවම් අඳින්නට ඇතැයි නන්දසේන විජේ සේකර මහතා විශ්වාස කෙරේ(මහින්ද හිමි ,2007:6). මහින්දාගමනයත් සමඟ බෞද්ධ සංස්කෘතිය මෙරට ව්‍යාප්ත වීමත් ඒ අනුව හැඩ ගැසුණ නව බෞද්ධ ශිෂ්ටාචාරයත් නිසාත් කලා ක්ෂේත්‍රය ශීඝ්‍ර දියුණුවකට ලක් විය. මෙම කාලයේ දී ප්‍රාග් ඓතිහාසික යුගයේ දඩයක් කරුවන් විසින් භාවිතා කරණ ලද ගල් ලෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා තමන්ගේ ආශ්‍රම හැටියට භාවිතා කිරීම නිසා අද අපට දක්නට ලැබෙන ලෙන් චිත්‍ර සම්ප්‍රදාය බිහි විය.(මහින්ද හිමි. 2007:8) ඒ අනුව බුදු දහම හා සම්බන්ධ පැරණි ම සිතුවම කරඹ ගල ලෙනෙහි සිතුවම වූ වද මේ වන විට ඒ සිතුවම ද විනාශ වී ඇත. මීට අමතරව ක්‍රි.පූ. 3 වන හා 1 වන සියවස් අතර කාලයකට අයත් විය හැකි යයි අනුමාන කෙරෙන සිතුවම් කැබලි කිහිපයක් සිතුල්පව්වට නුදුරු ව පිහිටි කොරවක්ගල ලෙනෙහි තිබී මංජු ශ්‍රී මහතා පිටපත් කර ගෙන තිබේ(මහින්ද හිමි,2007:19). මීට අමතරව යටාලතිස්ස රජු කරවන ලද සැලකෙන තිස්සමහාරාම යටාල චෛත්‍යයෙහි තිබී හමුව ඇත. ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ ආරම්භක අවදියේ සිතුවම් රාශියක් පහළ වලවේ නිම්නය ඇතුළු රෝහණ දේශයෙන් හමුව තිබීම තුළින් සිතුවම් කලාව හා සම්බන්ධ ව ඉතා වැදගත් තැනක් ප්‍රාදේශීය රාජ්‍යයක් වන රෝහණයට හිමි වන බව සනාථ කරයි.

ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ විකාශනයේ අවධිකරණය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී භාවිත ශෛලියෙහි ඇති වෙනස් කම් , ශිල්පක්‍රමයන්හි ඇති විවිධත්වය, වස්තු විෂය හා රේඛාකරණය, ආදිය මෙන් ම වර්ණ භාවිතයෙහි ඇති සුවිශේෂත්වය වැනි වෙනස්කම් ගණනාවක් ද සැලකිල්ලට ගනිමින් පැරණි ලාංකික චිත්‍ර කලාවෙහි අවධිකරණය සකස් කර ගත හැකිය. (සෝමතිලක,2004:22)

01 ක්‍රි.පූ. දෙවන සියවසට අයත් සිතුවම්, (කරඹගල)

02 ක්‍රි.ව. පස් වන සියවසේ සිට එකොළොස් වැනි සියවස දක්වා කාලයෙහි සිතුවම් (සීගිරිය, හිඳගල, දිඹුලාගල, මිහින්තලය)

03 ක්‍රි.ව. දොළොස් වන සියවස අවට කාලයේ සිතුවම් (තිවංක පිළිමගෙය, ගල්විහාරය)

04 ක්‍රි.ව. දහතුන හා දාහත සියවස අතර කාලයේ සිතුවම් (ගඩලාදෙණිය විහාර ශිඛරයේ චිත්‍ර )

05 දහඅට හා දහනව වැනි සියවස් කාලය අතර සිතුවම් (මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම්)

- **මහනුවර යුගයේ සිතුවම් කලාව**

ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් විකාශනයේ වැදගත් අවධියක් වන මහනුවර චිත්‍ර සම්ප්‍රදාය ද්විමාන සැරසිලි චිත්‍ර ක්‍රමයක් වීම සුවිශේෂ ලක්ෂණයකි . විසි වන සියවස මුල් දශක වල දී මහනුවර චිත්‍ර ශෛලිය ක්‍රමයෙන් අතුරුදහන් වී යනු පෙනී යයි. විසි වන සියවසේ මැද දක්වා ම රුහුණේ බොහෝ ප්‍රදේශ විදේශාධිපත්‍යය ක් පැවතීම මෙම උඩරට බෞද්ධ චිත්‍ර සමප්‍රදාය පිරිහීමට හේතු විය. පෙර දිග හා බටහිර මිශ්‍රණය සාර්ථක ලෙස සිදු වූ හා වැරදි ලෙස වටහා ගත් වික්ටෝරියානු ස්වාභාවික වාදය අනුකරණයෙන් යුත් කලා සම්ප්‍රදායක් පශ්චාද් මහනුවර යුගයේ සිදු විය. පැරණි ශ්‍රී ලංකාවේ කලා ප්‍රබෝධය සම්බන්ධයෙන් විමසීමේ දී මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සුවිශේෂී වෙයි.

- **මහනුවර යුගයේ බිතු සිතුවම් කලාවේ ව්‍යාප්තිය**

ප්‍රාග් ඓතිහාසික අවධියේ ස්වාභාවික ගල්ලෙන් ආශ්‍රිතව ඇරඹී ගලෙන් ගඩොලින් බැඳි බිත්ති ඔප මට්ටම් කොට වඩාත් දියුණු ලෙස චිත්‍ර ඇඳීමේ අවස්ථාව දක්වා බෞද්ධ සංස්කෘතිය ඔස්සේ සංවර්ධනය වූ සිංහල චිත්‍ර කලා සම්ප්‍රදාය පොළොන්නරු යුගයෙන් පසු අභාවයට ගිය මුත් ගැමියන් අතර ජන කලාවක් ලෙස චිත්‍ර කර්මය නො නැසී පැවතුනි. පොළොන්නරු යුගයෙන් පසු ව එළඹෙන රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීම හේතුවෙන් දඹදෙනිය , යාපහුව ,ගම්පොල, කෝට්ටේ,සීතාවක ආදී වශයෙන් රාජධානි කිහිපයක් බිහි වූ වත් එකී යුගවල චිත්‍ර කලාව පිළිබඳ ව අද වන විට කිසිදු සාධකයක් ඉතිරි ව නොමැති වූ වත් මෙම යුගවල දී අපේ සිත්තරුන් සිය ආවේණික ශිල්පීය හැකියාව වියැකී යා නොදී පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කර ගනිමින් කටයුතු කළ නමුත් මෙම කාල පරිච්ඡේදයේ මෙරට ඉදිකරන ලද වෙහෙර විහාර රාශියක ම අද දක්නට ඇත්තේ නුවර යුගයේ අඳිනා ලද සිතුවම් ය. ඉහත යුගයන් හි දී විවිධ ආක්‍රමණික බල පෑම් වලට ගොදුරු වෙමින් සිය ශිල්පීය හැකියාව පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මහනුවර යුගයේ යළිත් ස්මතු වෙමින් නව චිත්‍ර සම්ප්‍රදායක් ලෙස උඩරට විහාරස්ථාන කේන්ද්‍ර ගත කර ගනිමින් ව්‍යාප්ත වූ වද එම සිත්තර පරම් පරාවන්ගෙන් පහතරට ප්‍රදේශවල ව්‍යාප්ත ව සිටි සිත්තර පරම්පරාවන් විසින් මෙම චිත්‍ර සම්ප්‍රදාය පහතරට විහාරස්ථාන වලට ආරෝපනය කරන ලදි එම පරම්පරාවන්ගෙන් කඩෝල්ගල්ල, ගරඬුව, දෙනිපිටිය වැනි ප්‍රදේශවල ජීවත් වූ

සිත්තර පරම්පරා විසින් කරන ලද චිත්‍ර කර්මාන්ත පහත රට පුරා විසිරී තිබේ.

## පහළ වලවේ නිම්නයේ සිතුවම් කලා ඉතිහාසය (ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය සහ උඩරට අතර පැවති සම්බන්ධතාව ඉහත දක්වා ඇත)

- **අනුරාධපුර යුගය**

මෙරට පැරණි යුගයේ චිත්‍ර කලාව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සුවිශේෂී ස්ථානයක් මූලාශ්‍රයවල අන්තර්ගත තොරතුරු වලට හිමි ව පවතී. ඒ අනුව අනුරාධපුර අවධියේ චිත්‍ර කලාව සම්බන්ධව මහාවංශයේ සඳහන් තොරතුරු වලට අනුව ක්‍රිස්තු පූර්ව තුන් වන ශතවර්ෂයේ දී පමණ මෙරට පැවති චිත්‍ර කලාව හා සම්බන්ධව තොරතුරු සඳහන් ව ඇත. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සිදු කරණ වෙළි ඔය පහළ නිම්නයේ අනුරාධපුර අවදියේ චිත්‍ර කලාව සම්බන්ධව විමර්ශනය කිරීමේ දී සිරි මේඝවණ්ණ රාජ සමයට අයත් ( ක්‍රි. ව.303 - 331) ශිලා ලේඛන යේ බිලිව (න) විහාරය ලෙසින් හඳුන් වන කරඹ ගල ආරණ්‍යය සේනාසනය ඉතා වැදගත් වේ. කරඬුවක් ලෙස ඇතට මෙම භූමිය දර්ශනය වීම හේතුවෙන් කරඬු ලෙන ලෙසින් ව්‍යවහාර වන බවට ජනප්‍රවාදයක් ඇත. මෙම විහාරය පූර්ව බ්‍රාහ්මීය ලෙන් ලිපි සහිත ලෙන් රාශියකින් යුතු විහාරස්ථානයකි.

බුද්ධ ඝෝෂ හිමියන්ගේ විශුද්ධිමාර්ගයේ සඳහන් කර ඇති ආකාරයට ඉන්ද්‍රිය සංවරයට අසීමිත ලෙස කැප වූ චිත්ත ගුත්ත තෙරුන් අවුරුදු හැටක් වාසය කළ ද තමන් වාසය කළ ලෙනේ ඉහල ඇද තිබෙනා වූ සිතුවම් නො දුටු කුරුන්දක ලෙන මෙම භූමියේ පිහිටා ඇත. මෙම කුරුන්දක ලෙන බවට විශ්වාස කෙරෙන ලෙනෙහි බදාම ස්ථරයන් මත රක්ත වර්ණයෙන් ඇති සිතුවම් දැනට ද ශේෂ ව පවතී. විශුද්ධිමාර්ගයේ සඳහන් කර ඇති ආකාරයට "එක් සමයෙක භික්ෂූන් පිරිසක් ඇස පිය කරවන සිත්තම් නරඹමින් ලෙනෙන් ලෙන යන්නාහු කුරුන්දක ගල් ලෙනට ද පැමිණියහ මේ ලෙනෙහි විපස්සී, සිඛී, වෙස්සභූ , කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම, යන සත් බුදු වරුන්ගේ බුදු බව ලැබීම සඳහා පැවිදි වන්නට යන යැම් දක්වන සිත්තම් දුටු ඔවුහු එහි විසූ මහ තෙරුනු අමතා මේ සිත්තම් සිත් අලවන්නේ යැයි කීහ, එසද මහ තෙරනු ඔවුන් අමතමින් මෙසේ කීහ. මේ ලෙනෙහි වසන මම අවුරුදු හැටක් මෙහි ම ගත කිලෙමි එහෙත් එබදු සිත්තම් කිසිකලෙකත් මම නොදුටිමි" (මහින්ද හිමි,2007:14) යනුවෙන් සඳහන් කර ඇත. මෙම ලෙනෙහි චිත්තගුත්ත මහ තෙරනුවන් වාසය කළ බව සඳහන් වේ. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර වල මෙන් ම විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් කරුණු මගින් ද ලංකාවේ විවිධ ස්ථාන වලින් හමු වූ අභිලේඛන මූලාශ්‍ර වළ සඳහන් කරුණු මගින් ද පැරණි යුගයේ පටන් මෙරට දියුණු චිත්‍ර කලාවක් පැවති බව සනාථ කරයි. අනුරාධපුර අවධියේ පැවති චිත්‍ර කලාව සම්බන්ධව විමසා බැලීමේ දී පහළ වලවේ නිම්නයේ කරඹගල ලෙන් විහාරය ඇතුළුව පුරාණ රෝහන රාජධානියට අයත් සිතුල්පව්ව විහාරය, , මහියංගණය සහ අනුරාධපුර රාජධානියට අයත් මිහින්තලය, සීගිරිය, හිඳගල, යනාදී ස්ථානයන් හි ශේෂ ව ඇති බිතු සිතුවම් සුවිශේෂී වේ. මෙහි දී මිහින්තලය සහ

හිඳගල යනාදී ස්ථානයන් ගෙන් හමු වූ චිත්‍ර පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කාල නිර්ණය අනුව එම චිත්‍ර අනුරාධපුර යුගයේ අගභාගයේ දී අදින ලද සිතුවම් ලෙස සැලකෙනු ලබයි.

අනුරාධපුර යුගයේ සිතුවම් පිළිබඳ ව සැලකීමේ දී මේවායේ සම්මත වර්ණයක් පැවති බව පෙනී යයි. වලවේ නිම්නයේ කරඹ ගල, ඇතුළුව හිඳගල, සිතුල්පව්ව, මහියංගණය, දිඹුලාගල, ආදි සෑම ස්ථානයකින් ම හමු වූ සිතුවම් පිළිබඳ ව විමසා බැලීමේ දී රේඛාමය චිත්‍ර ඇඳීමේ කලාවක් මෙම කාලයේ සුලබ ව පැවති බව සනාථ කරයි. රේඛා කරණය පිළිබඳ ව ඇති උසස් නිර්මාණ ශක්තිය මෙම සියලු ම සිතුවම් වලින් කැපී පෙනෙන අතර වර්ණ යොදා ගැනීමේ දී ඒ සඳහා නිතරම ස්වාභාවික ද්‍රව්‍ය යොදා ගත් බවට සාක්ෂි හමුව ඇත. වර්ණ යොදා ගැනීමේ දී රතු, කහ, සුදු, කළු, වර්ණ ප්‍රධාන වර්ණ ලෙසින් යොදා ගෙන ඇත. ලංකා ඉතිහාසයේ මෙතෙක් හමු වී ඇති පැරණිතම බුද්ධ චිත්‍රය හිඳගලින් හමුව ඇත. කරඹ ගල තිබූ රේඛා මය සිතුවම් මේ වන විට සම්පූර්ණයෙන්ම විනාශ ව ගොස් ඇත.

අනුරාධපුර අවදියේ පටන් අජන්තා චිත්‍ර සම්ප්‍රදාය අඛණ්ඩව ම ලංකාවේ 12 වන සියවස දක්වා ම පැවති බවට විවිධ ප්‍රදේශයන්හි කරණ ලද ගවේෂණ තුළින් සාධක හමුව ඇත. නමුත් වලවේ නිම්නයේ එවැනි චිත්‍ර සම්ප්‍රදායක් පැවති බවට සාධක හමුවී නොමැත.

ජනප්‍රිය ප්‍රදේශවල සිතුවම් කලාවේ ඉතිහාසය සම්බන්ධව බොහෝ පර්යේෂකයන්ගේ මෙන් ම බොහෝ ග්‍රන්ථ කතුවරුන් ගේ වැඩි අවධානය යොමුව ඇති පසුබිමක ප්‍රාදේශීය ඉතිහාසය හඳුනා ගැනීම සඳහා සිතුවම් කලාව ප්‍රාථමික මූලාශ්‍රයක් වන බව සනාථ කරමින් බොහෝ පර්යේෂකයන්ගේ අවධානයෙන් ගිලිහී ගිය ලංකාවේ ප්‍රාදේශීය රාජධානියක් වන රෝහණ රාජධානියට අයත් පහළ වලවේ නිම්නයේ මහනුවර යුගයේ සිතුවම් කලාව ව්‍යාප්ත ව තිබූ බව මෙම පර්යේෂණයේ දී තහවුරු කර ගත හැකි විය. ඒ සඳහා පහළ වලවේ නිම්නයේ විමර්ශනයට ලක් කරණ පහත සඳහන් ස්ථානයන්හි දී මහනුවර යුගයේ පහත රට බිතු සිතුවම් රාශියක් හඳුනා ගැනීමට හැකි විය.

- **හාතාගල පුරාණ රාජ මහා විහාරය (ක්‍රි.ව 1699)**

පහළ වේළිඔය නිම්නයේ නුවර යුගයේ ඉදි වූ විහාරස්ථානයක් ලෙස හාතාගල රාජමහා විහාරය වැදගත් ස්ථානයක් හිමි කර ගෙන ඇත. වර්තමාන මාතර තිස්ස ප්‍රධාන මාර්ගයේ හුංගම නගරය ආසන්නයේ පිහිටි හාතාගල හන්දියෙන් හැරී මීටර 850ක් පමණ දුරක් ආ විට මෙම හාතාගල පුරාණ විහාරය නම් සුපිංබිම හමුවේ. ස්වාභාවික වෘක්ෂලතා වන් ගෙන් ගහන රමණීය පරිසරයකින් යුත් ඉතා ශාන්ත වටාපිටාවකින් අනූන මෙම විහාරය ක්‍රි.ව 1699 වර්ෂයේ දි උඩුපිටියේ සිල්වතුන් වහන්සේ (ක්‍රි.ව 1699 - 1769) විසින් ආරම්භ කර ඇත. උඩරට රාජධානිය ඇතුළු සමස්ත ලංකාව ම අභ්‍යන්තර අවුල් වියවුලට හා විදේශ ආක්‍රමණයන්ගේ

තර්ජනයට පත් දේශපාලනික වශයෙන් අස්ථාවර කාල වකවානුවක පහළ වේළිඹය නිම්නයේ ආරම්භ කරණ ලද මෙම විහාරස්ථානය ආරම්භ කරණ කාලයේ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිවුණි නම් එය ඉතා සීමාසහිත ආකාරයෙන් සිදු වූ යුගයක් විය. විශේෂයෙන් පහත රට ප්‍රදේශ විදේශීය ආක්‍රමණයකට ලක් ව පැවති කාලයක මෙම විහාරය ආරම්භ ව ඇති බව පෙනී යයි. රාජගුරු වගේගොඩ ඉන්ද්‍ර සාර හිමියන් (ක්‍රි.ව1769 -1788) ගේ කාලයේ මෙරට පාලනය කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ශීඝ්‍ර සංවර්ධනයට ලක් විය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී මහනුවර රාජධානිය ආගමික වශයෙන් ලැබූ පුනර්ජීවනය පහත රට ප්‍රදේශයේ ද පැවති බව පෙනී යයි. එනම් වැලිවිට සංඝරාජ හිමියන්ගේ අනුශාසනයත් කීර්ති ශ්‍රී රජුන්ගේ අග්‍ර දායකත්වය ද එක් වීම සමඟ මහනුවර රාජධානිය පුරා බෞද්ධාගමික පුනර්ජීවනයක් සේම සංස්කෘතික පුනර්ජීවනයක් ද ඇති විය. එම බෞද්ධාගමික පුනර්ජීවනය සහ සංස්කෘතික පුනර්ජීවනය මෙම කාලයේ දි ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වලට ද ව්‍යාප්ත වූ බව පෙනේ. එම කාලයේ දී හාතාගල විහාරයේ ඉදි කරන ලද මෙම ටැම් පිට විහාරය මහනුවර යුගයේ පැවති සිතුවම් කලාව පිළිබඳ ව සහ එම කාලයේ පැවති සිතුවම් වල ලක්ෂණ යත් කෙබඳු බද යන්න මනාව ප්‍රකට කරනු ලබයි. එම කාලයේ අඳිනු ලැබූ සිතුවම් අද දක්වා ම පවතින නමුත් මේ වන විට එම සිතුවම් ක්‍රමයෙන් මැකී යමින් පවතී.

මහනුවර යුගයේ චිත්‍ර ශිල්පියා තම නිර්මාණ සඳහා දිව්‍යලෝක දර්ශන අපාය දර්ශන නිරූපණය කිරීමෙන් මිනිසා පිනට නැඹුරු කරවීමත් පවට බිය වැද්දීමත් අපේක්ෂා කරන ලදී. එනිසා ඔහු ස්වකීය සිතුවම් සඳහා දිව්‍යලෝක දර්ශන මෙන් ම අපාය දර්ශන පදනම් කර ගෙන තිබේ. පරසිරිතට ගැතිවූ කාමබෝගී ජීවිතයට හුරුව ධර්මයෙන් ඈත් වන මිනිසාට එහි ආදීනව කියාදීමට චිත්‍ර ශිල්පියා උත්සහ කර ඇති බව පෙනේ. එසේම මෙම විහාරයේ අපාය දර්ශන ආදිය නිරූපණයෙන් පෙනෙන්නේ නුවර චිත්‍රවල පැවති බෞද්ධ ආභාසය මෙම විහාර සිතුවම් තුළ පවතින බවයි. සමකාලීන වෙනත් රටවල චිත්‍ර කලාවන්හි ආභාසය ද මෙම විහාරයේ ඇති චිත්‍රවල දක් නට ලැබේ. සියම් බුදු පිළිම වල තිබූ සිරස් පත කේතුමාලාව බුදු පිළිම වල දක් නට ලැබේ. නාරිලතා ලිය පත්‍ර ආදී මෝස්තර රටා වන්හි සියම් බලපෑම දක්නට ඇත. මහනුවර යුගයේ පහත රට විහාර වල අඳිනා ලද චිත්‍ර ලක්දිව චිත්‍ර කලාවේ වැදගත් සංධිස්ථානයකි. විදේශීය ආක්‍රමණික බලපෑම් පැවති සමයක විවිධ දුෂ්කරතා මධ්‍යයේ කළ කාර්යයක් බැවින් මහනුවර යුගයේ පහළ වලවේ නිම්නයේ ඇති මෙම චිත්‍ර අගය කළ හැකි ය. මෙම යුගයේ පැවති චිත්‍ර වල පැවති ඇතැම් ලක්ෂණ පිළිබඳ ව මෙම විහාරයේ ඇති සිතුවම් තුළින් අනාවරණය කර ගත නො හැකි ව ඇත. එනම් බොහෝ සිතුවම් මේ වන විට විනාශ ව පැවතීම එයට හේතුවයි.



*(ඡායාරූපය. ටැම්පිට විහාරයේ ඇද ඇති අපාය දක්වන සිතුවම) (කැළුම්, 2020)*

මෙම සිතුවම් මේ වන විට මැකී යන තත්වයට පත් ව ඇත. මෙම සිතුවම මගින් අපාය පිළිබඳ ව නිරූපනය වී ඇත. නමුත් මේ වන විට මෙම සිතුවම ක්‍රමයෙන් විනාශයට පත් ව ඇත . මෙම විහාරයේ ඇති විෂ්ණු දෙවියන් ගේ සහ කතරගම දෙවියන්ගේ පිළිම මගින් එම යුගයේ මෙරට පැවති හින්දු ආගමික දේව සංකල්ප බුදු දහම හා සම්බන්ධව පැවති බව සනාථ කරණ අතර මෙම කාල පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාව පාලනය කල නායක්කාර් වංශික රජවරු ද උඩරට රජ කළ බෞද්ධ පාලකයින් මෙන් ක්‍රියා කර ඇති බව පෙනී යයි. මෙහි ඇතුළත ඇති සිතුවම් ද මේ වන විට මැකී යමින් පවතී.





*(ඡායාරූපය. හාතාගල විහාරයේ සිතුවම් හා ප්‍රතිමා)*
*(මූලාශ්‍රය.සාගර කැළුම් ජේ.ඊ.ජේ.2020)*

- **ගංගාරාම පුරාණ විහාරය වැලිපටන්විල (ක්‍රි.ව. 1743)**

පහළ වලවේ නිම්නයේ නුවර යුගයේ ඉදිවූ විහාරස්ථානයක් ලෙස ගංගාරාම පුරාණ විහාරය ද වැදගත් ස්ථානයක් හිමි කර ගෙන ඇත. වර්තමාන මාතර තිස්ස ප්‍රධාන මාර්ගයේ අම්බලන්තොට නගරය ආසන්නයේ පිහිටි කිරළ කැලේ

ආසන්නයේ ඇති චාල්ස්පට්ටිය කුඹුර මාවත හන්දියෙන් හැරී කිලෝ මීටර 4ක් පමණ දුරක් වෙරළ ප්‍රදේශයට ආ විට මෙම ගංගාරාම පුරාණ විහාරය නම් සුපිංබිම හමුවේ. ස්වාභාවික වෘක්ෂලතා වන් ගෙන් ගහන වෙරළ තීරයේ රමණීය පරිසරයකින් යුත් ඉතා මනරම් වටාපිටාවකින් අනූන මෙම විහාරය ක්‍රි.ව. 1743 වර්ෂයේ දි පමණ ආරම්භ කර ඇති බව විහාරාධිපති දෙනිපිටියේ විමලධම්ම හිමි පවසයි. නමුත් මේ වන විට මෙම විහාරයේ ඉපැරණි තොරතුරු කිසිවක් නොමැති අතර 2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යවසනය හේතු කොට ගෙන මෙම බොහෝ තොරතුරු විනාශ වී ඇත. ලංකාවේ ඉදිකර ඇති පිරිත් මණ්ඩප අතරින් තුන් වන ස්ථානය හිමි කර ගන්නා පිරිත් මණ්ඩපය මෙහි දක්නට ඇත. මෙම පිරිත් මණ්ඩපයට වඩා ප්‍රමාණයෙන් විශාල අනෙක් පිරිත් මණ්ඩප දෙක මහනුවර සහ කුරුණෑගල ප්‍රදේශවල ඉදි කර ඇත. මෙම පිරිත් මණ්ඩපය පුරාම මහනුවර යුගයේ සිතුවම් දක්නට ලැබේ. නමුත් සුනාමි ව්‍යවසනය නිසා මෙහි ඇති සිතුවම් දැඩි සේ හානියට පත් වී ඇති අතර තවමත් ඒවා යම් තරමකට ඉතිරි ව පවතිනු දක්නට ලැබේ. මෙම සිතුවම් අතර පිරිත් මණ්ඩපය පුරා විවිධ අලංකාරික මල් ලිය වැල් රටා සහිත සිතුවම් දක්නට ලැබේ. මණ්ඩපයෙහි පාදම කොටසේ ජාතක කථා නිරූපනය කර ඇත. නමුත් එහි ඇති සිතුවම කුමන ජාතක කතාවක් නිරූපනය කරනවාද යන්න හදුනා ගැනීමට නො හැකිවී ඇත. මෙහි තේලපත්ත ජාතක කතාව නිරූපනය කර ඇතැයි විහාරාධිපති හිමියන් අනුමාන කරයි. මෙම යුගයේ පැවති චිත්‍රවල පැවති ඇතැම් ලක්ෂණ පිළිබඳ ව මෙම විහාරයේ ඇති සිතුවම් තුළින් අනාවරණය කර ගත නො හැකිය. එනම් බොහෝ සිතුවම් මේ වන විට විනාශ ව පැවතීම එයට හේතුවී ඇත නමුත් මහනුවර යුගයේ සිතුවම් කළාව පිළිබඳ ව යම් අවබෝධයක් මෙම සිතුවම් අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකිය.



*(ඡායාරූපය. ගංගාරාම පුරාණ විහාරයේ පිරිත් මණ්ඩපයේ සිතුවම් )*
*(මූලාශ්‍රය.සාගර කැළුම් ජේ.ඊ.ජේ.2020)*



*(ඡායාරූපය. ගංගාරාම පුරාණ විහාරයේ පිරිත් මණ්ඩපයේ සිතුවම් )*
*(කැළුම්, 2020).*

- **පුලිනතලා රාම පුරාන විහාරය වැලිපටන් විල**

පහළ වලවේ නිම්නයේ නුවර යුගයේ ඉදිවූ විහාරස්ථානයක් ලෙස වැලිපටන්විල පුරාණ විහාරය ද වැදගත් ස්ථානයක් හිමි කර ගෙන ඇත. වර්තමාන මාතර තිස්ස ප්‍රධාන මාර්ගයේ අම්බලන්තොට නගරය ආසන්නයේ පිහිටි කිරළ කැලේ ආසන්නයේ ඇති චාල්ස්පට්ටිය කුඹුර මාවත හන්දියෙන් හැරී කිලෝ මීටර **4**ක් පමණ දුරක් වෙරළ ප්‍රදේශයට ආ විට මෙම පුරාණ විහාරයට ළඟා විය හැකි ය. මෙම විහාරයට එක් පසකින් ගංගාරාම විහාරය පිහිටා ඇත. ස්වාභාවික වෘක්ෂලතා වන් ගෙන් ගහන වෙරළ තීරයේ රමණීය පරිසරයකින් යුත් ඉතා අලංකාර වටාපිටාවකින් අනූන මෙම විහාරය ක්‍රි.ව 1806 වර්ෂයේ දි පමණ ආරම්භ කර ඇති බව විහාරාධිපති දම්මරතන හිමි පවසයි. (සම්මුඛ සාකච්ඡාව: පූජ්‍ය ධම්මරතන හිමි සමඟ). නමුත් මේ වන විට මෙම විහාරයේ ඉපැරණි තොරතුරු කිසිවක් නොමැති අතර 2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යවසනය හේතු කොට ගෙන මෙම බොහෝ තොරතුරු සහ මෙහි තිබූ සිතුවම් විනාශ වී ඇත. මෙම විහාර මන්දිරයේ ඉහළ කොටසේ පමණක් තවමත් ඉපැරණි සිතුවම් ඉතිරිව පවතිනු දක්නට ලැබේ.









*(ඡායාරූපය. වැලිපටන්විල පුරාණ විහාරයේ සිතුවම් )*
*(මුලාශ්‍රය.සාගර කැළුම් ජේ.ඊ.ජේ.2020)*

මෙම විහාරයේ මේ වන විට ඉතිරිව පවතින සිතුවම් තුළින් බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා රාශියක් නිරූපනය කර ඇත. සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්ම යාම ,සත් සතිය, වැනි අවස්ථා මෙහි නිරූපනය කර ඇති බව පෙනී යයි. විනාශ ව ගිය සිතුවම් අතර ජාතක කථා දස පාරමිතා වැනි දෑ නිරූපනය කර පැවති බව විහාර වාසී භිකන්ෂුන් වහන්සේලා පවසයි. මෙම මහනුවර යුගයේ පැවති චිත්‍ර කලාවෙහි පැවති ඇතැම් ලක්ෂණ පිළිබඳ ව මෙම විහාරයේ ඇති සිතුවම් තුළින් අනාවරණය කර ගත නො හැකි ව ඇත. එනම් බොහෝ සිතුවම් මේ වන විට විනාශ ව පැවතීම එයට හේතු වී ඇත නමුත් මහනුවර යුගයේ සිතුවම් කලාව පිළිබඳ ව යම් අවබෝධයක් දැනට දක්නට ඇති සිතුවම් අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකි ය. මෙම විහාරයේ සිතුවම් හා සමාන සිතුවම් සහිත විහාරයක් වලවේ නිම්නයට තරමත් දුරින් පිහිටි රන්න කහදාව පුරාණ විහාරයේ දක්නට ලැබේ. එම විහාරය 1906 වර්ෂයේ දී පමණ

- **වලවේ නිම්නයේ නුවර යුගයේ සිතුවම් ශෛලිය ඇසුරින් තත්කාලීන ඉතිහාසය නිරූපණය වන ආකාරය**

මහනුවර රාජ සමයේ උඩරට සහ පහතරට යනාදී වශයෙන් පුළුල් ප්‍රදේශයක් තුළ ප්‍රචලිත වූ චිත්‍රකලා සම්ප්‍රදාය සියවස් ගණනාවක් මුළුල්ලේ පරම්පරාවෙන් පරම්පරාවට රැක ගෙන පැමිණි පැරණි ලාංකික චිත්‍ර කලා සම්ප්‍රදායෙහි ඉතා සුවිශේෂී අවස්ථාවක් වේ. පොළොන්නරු යුගයෙන් පසු ව එල බෙන රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීම හේතුවෙන් දඹදෙණිය, යාපහුව ,ගම්පොළ, කෝට්ටේ, සීතාවක ආදී වශයෙන් රාජධානි කිහිපයක් බිහි වූ වත් එකී යුගවල චිත්‍ර කලාව පිළිබඳ ව අද වන විට කිසිදු සාධකයක් ඉතිරි ව නොමැත. කෝට්ටේ යුගයේ දී එනම් ක්‍රි.ව. 1505 න් පසු ලංකා භූමිය විදේශීය ජාතින් ගේ යටත්විජිතයක් බවට පත් වීමත් සමග රාජ්‍ය අනුග්‍රහයක් නොමැති වීම නිසා පෙර කී යුගවල මෙරට ඉදි කරණ ලද බෞද්ධ වෙහෙර විහාර අභාවයට ගිය අතර කීර්ති ශ්‍රී රජසිංහ රජුගේ පාලන සමයේ අභාවයට පත් වූ වෙහෙර විහාර රාශියක් නැවත් ප්‍රතිසංස්කරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම විහාර රාශියක ම වර්තමානයේ දක්නට ඇත්තේ උඩරට රාජධානි සමයේ අදිනා ලද නුවර සම්ප්‍රදායේ සිතුවම් ය. පොදුවේ ගත් කල මහනුවර සම්ප්‍රදායේ සිතුවම් පිළිබඳ පර්යේෂණ සිදු කල බොහෝ පර්යේෂකයින් නුවර යුගයේ සිතුවම් වල දක්නට ඇති තේමා වන් ප්‍රධාන කරුණු පහක් යටතේ හඳුනා ගෙන ඇත.

1 බුදුන් වහන්සේගේ පූර්ව ආත්ම භවයක් විස්තර කෙරෙති යි සලකන ජාතක කතා, සූ විසි විවරණ හා දස පාරමිතා ඇතුළත් සිතුවම්.

2 බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා මාර පරාජය, සත් සතිය, නාළාගිරි දමනය, බුද්ධ චරිතය සම්බන්ධයෙන් පටාචාරා, මච්චරිය කෝසිය කථාව, සෝරෙය්‍ය සිටු පුතාගේ කථාව සාම ජාතකය, වෙස්සන්තර , සස, සුතසෝම, දේවධර්ම, තේලපත්ත ආදී ජාතක කථා නන්දිය වත, තෙර සරණ ආදී විශේෂ අවස්ථා.

3 අටමස්ථාන, සොළොස්මස්ථාන ඊට සම්බන්ධ රාජකීය පෙළැන්ති දායකයින්,විහාර අනුග්‍රාහකයින් ,සුප්‍රකට තෙර වරු, ශක්‍ර , උපුල් වන්,සමන් හා නාථ දෙවි වරු.

4 නව ග්‍රහ මණ්ඩලය,රාශි චක්‍රය,නැකැත් විසිහත,විසිඅට අපාය පිළිබඳ විශ්වාස නිරූපිත චිත්‍ර.

5 අලංකාරික මල් ලිය වැල් රටා සහිත සිතුවම් (සෝමතිලක,2004:116¸117)

ඇතැම් විහාරයන් හි ඉහත සියළුම තේමාවන් සහිත සිතුවම් දක්නට ලැබෙන අතර සමහර තැන් හි එක් තේමාවක් හෝ කිහිපයක් උදෙසා සිතුවම් නිර්මාණය වී තිබේ.

නුවර යුගයේ සිතුවම් කලාව පිළිබඳ ව පර්යේෂකයින් මෙම යුගයේ චිත්‍ර වල විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනා ගෙන ඇත.

1චිත්‍ර සඳහා යොදා ගත් වර්ණ සීමා කිර ඇත. තද කොළ, රතු , කහ වැඩිපුර යොදා බාහිර රේඛා කළු පාටින් ආවරණය කොට ඇත.

2 චිත්‍ර වලට සහ සැරසිලිවලට යොදා ගත් පසුබිම රතු පාටින් වැඩි කර ඇත.

3 කුලයෙන් උසස් අය දැක්වෙන රූප සටහන් සඳහා කහ පාට යොදා ගෙන ඇත.

4 රාක්ෂ, යක්ෂ, සහ කුලයෙන් පහත් අය දැක්වීම සඳහා කොළ මිශ්‍ර අළු පාට යොදා ගෙන ඇත,

5 සියලුම චිත්‍රයන් නිරූඪ භාවයෙන් තැබීම

6 රිද්මයට සහ සරල භාවයට විශේෂ තැනක් දීම

7 මෝස්තරයක් හෝ චිත්‍ර කතාවක් සේ ජාතක කතාවක් හෝ කතා වස්තුවක් නිර්මාණය කිරීම (හේම ශ්‍රී ,2000:28)

උඩරට සහ පහතරට නුවර යුගයේ සිතුවම් සහිත විහාරයන් හි සිතුවම් සහ පහළ වලවේ නිම්නයේ මෙම පර්යේෂණය සිදු කරණ හාතාගල, ගංගාරාමය සහ පුලිනතලාරාමය යන පුරාණ විහාරයන් හි සිතුවම් පිළිබඳ ව විමසීමේ දී මෙම සිතුවම් හි වර්ණ භාවිතය, ඇඳුම්, ආභරණ, ආදී ලක්ෂණ තුළින් නුවර යුගයේ සිතුවම් ශෛලිය සහ  සමකාලීන සමාජය හඳුනා ගත හැකිය.  පොදුවේ ගත් කල උඩරට සහ පහතරට නුවර යුගයේ සිතුවම් ඇති විහාරයන් හි තේලපත්ත ජාතකය, වෙස්සන්තර ජාතක කතාව, සුතසෝම ජාතකය ආදී වශයෙන් සිතුවම් නිරූපනය කර ඇති අතර එම සිතුවම් හි ඇති නිවාස, ඇඳුම්, ගෘහ උපකරණ ආදී ය බටහිර ස්වරූපයක් ගෙන ඇත.  එනම් ශෛලබිම්බාරාමයේ  විහාර සිතුවම් හි විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා යුරෝපීය ඇඳුමින් සැරසී සිටීම, දායාද ඉල්ලීමට බුදුන් වහන්සේ වෙත යන රාහුල කුමරු ගවුමක් ඇඳ සිටීම සූ විසි බුදු වරුන් සුව පහසු පුටු වල වාඩිවී සිටීම, (මහින්ද හිමි. 2007:67), යනාදි සිතුවම් ලක්ෂණ මගින් මේ වන විට රට තුල ඇති බටහිර කරණය සිතුවම් කෙරෙහි ද බලපෑම් කර ඇති බව සනාථ කරයි. කතළුව පූර්වාරාමයේ සිතුවම් තුළ  බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනය ඇතුළත් කිරීම. යුරෝපීය ඇඳුමින් සැරසී තුවක්කු ගත් මුර භටයන් සිතුවම් කිරීම (මහින්ද හිමි,2007:83) ඉහත කරුණු සනාථ කරයි.

පහළ වලවේ නිම්නයේ  ඇති විහාර සිතුවම් තුලත් බටහිර ඇඳුම් . ගෘහ උපකරණ, නිවාස, වැනි ලක්ෂණ  දක්නට ඇත. එනම් ගංගාරාමය සහ පුලිනතලා රාමයේ සිතුවම් තුලත් මෙම බටහිර බලපෑම පැවති බවට සලකුණු දක්නට ලැබෙන මුත් එම සිතුවම්  මේ වන විට මැකී ගොස් තිබේ.  හාතාගල විහාරයේ දක්නට ඇත්තේ අපාය පිළිබඳ සිතුවම් ය. අවාසනාවකට මේ වන විට එම සිතුවම් සියල්ල විනාශ ව ඇත. නමුත් සමකාලීන සමාජයේ බටහිර කරණයත් සමග මිනිසුන් ධර්මයෙන් ඈත් වීමක් දක්නට ලැබුනු බව පෙනේ එබැවින් පාපයේ ආදීනව පෙන් වීම සඳහා මෙම සිතුවම් නිර්මාණය කරන්නට ඇත. පුලිනතලා රාම විහාරයේ මෙන්

ම කහදාව විහාරයේත් සිවිලිමේ සිතුවම් කර ඇති ලග්න සංකේත. නැකැත් විසිහත ආදිය විමසීමේ දී නැකැත් ශාස්ත්‍රය කුමන ආකාරයකින් මිනිස් සමාජය වෙත බලපෑවේ ද යන්න අවබෝධ කර ගත හැකිය. මුල්කිරිගල විහාරයේ අඹන ලද විෂ්ණු , කතරගම දේව රූප හා සමාන ලෙස හාතාගල විහාරයේ ද අඹන ලද විෂ්ණු , කතරගම දේව රූප දක්නට ඇත. එබැවින් මෙම නුවර යුගයේ සිතුවම් තුළ සම කාලීන සමාජයේ තිබූ ඇතැම් හින්දු දේව විශ්වාස වැනි සංකල්ප ද නිරූපනය කර ඇති බව පෙනී යයි. පොදුවේ ගත් කළ නුවර යුගයේ වලවේ නිම්නයේ විහාර සිතුවම් තුළින් සමකාලීන ඉතිහාසය නිරූපිත බව පෙනී යයි.

## සමාලෝචනය

අනුරාධපුර අවදියේ ප්‍රාදේශීය පාලන ඒකකයක් ලෙස ආරම්භ වන රෝහණ රාජධානියට අයත් පහළ වලවේ නිම්නයේ සිතුවම් කලාව ආරම්භ වූ ආකාරය සහ දහසය වන ශතවර්ෂයේ සිට එනම් මෙම මුහුදු බඩ පලාත් යුරෝපීය ජාතීන් ගේ යටත්විජිතයක් ව පැවති සමයේ සිට මෙම සිතුවම් කලා සම්ප්‍රදාය කවර ආකාරයකින් වෙනස් වූ වාද යන්න මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරන ලදි. මෙවැනි දුෂ්කර පසුබිමක මෙම යටත්විජිත පාලන සමයේ විහාර කර්මාන්තය නගා සිටු වීම පිණිස දායක වූ කලා විශාරදයින් කවුරුන් ද යන්න සහ ඔවුන් විසින් පහළ වලවේ නිම්නයේ හාතාගල, පුලිනතලාරාමය, ගංගාරාමය, ආදී පුරාණ විහාර ඇතුළු සමස්ත ලංකාවේ ම විවිධ ස්ථානය න් හි චිත්‍ර සම්ප්‍රදාය ඇතුළු අනෙකුත් කලා සම්ප්‍රදායන් දියුණු කළ ආකාරයත් මෙම පර්යේෂණයෙන් හඳුනා ගන්නා ලදි. මෙම පර්යේෂණ ප්‍රදේශයේ සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් මූලාශ්‍රය ලේඛන යන් හි සඳහන් නොවන තොරතුරු රාශියක් හඳුනා ගන්නා ලදි. විශේෂයෙන් නුවර යුගයේ විහාර චිත්‍ර සම්ප්‍රදායේ ව්‍යාප්තිය, සමාජ පරිහානියේ ස්වරූපය, මෙහි දී හඳුනා ගත හැකි ය . විහාර චිත්‍ර නිර්මාණ කරුවන් ගේ අරමුණ වූයේ සිතුවම් තුලින් බිත්ති සැරසීමට වඩා මෙම සිතුවම් උපයෝගී කර ගනිමින් බෞද්ධ ගුණ ධර්ම පිළිබඳ ව ජනතාවට අවබෝධයක් ලබා දීම බව පෙනී යයි. මෙම සිතුවම් වල වස්තු විෂය සහ තේමා වන් තෝරා ගැනීමේ දී සමාජ තත්වය කෙරෙහි අවධානය යොමුව ඇති බව හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව මහනුවර යුගයේ චිත්‍ර ලක්දිව චිත්‍ර කලාවේ වැදගත් සංධිස්ථානයක් බව පෙනී යයි. සමාජයේ සදාචාර වර්ධනය සඳහා විවිධ දුෂ්කරතා මධ්‍යයේ කළ කාර්යයක් ලෙස පහළ වලවේ නිම්නයේ මහනුවර යුගයේ සිතුවම් අගය කළ හැකි ය. විශේෂයෙන්ම පූර්ව පර්යේෂකයන් අවධානය යොමු නොකළ අංශ වන පහළ වළවේ නිම්නයේ චිත්‍ර ඇසුරින් හෙළිවන සමකාලීන සමාජය වැනි අංශ මෙහිදී සාකච්ඡා කෙරිණි. එබැවින් ඒ සම්බන්ධයෙන් සුවිශේෂී නිගමනවලට එළඹීමේ හැකියාව ලැබිණි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ප්‍රාථමික මූලාශ්‍රය**

මහාවංශය. (2003). (සංස්). දේවරක්ෂිත බටුවන්තුඩාවේ කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ද්වීතික මූලාශ්‍රය**

අත්තනායක, අනුලා. (1994). ***දහනම වැනි සියවසේ බ්‍රිතාන්‍යයන් දුටු ලංකාව.*** කොළඹ: සුලලිත මුද්‍රණ.

ඉලයප්ආරච්චි,එරික්. (1995). ***චිත්‍ර කලාව සහ විචාරය.*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මහානාම, මංගලසිරි. (1996). ***රුහුණු පුදබිම.*** දක්ෂිණ ලංකා තරුණ ලේඛක සංගමය.

මහින්ද,හිමි,උනුවතුර බුබුලේ. (2007). ***දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර*** .කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

විතානගේ, පුණ්‍යදාස. (2007). ***චිත්‍ර කලාව ඇගයීම.*** කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමා

සෝමතිලක, මහින්ද. (2004). ***පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව.*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

හේම ශ්‍රී, අමරසිංහ. (2000). ***චිත්‍ර කලාව.*** ගනේමුල්ල: නිශාන්ත ප්‍රකාශන.